සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

09 ශ්‍රේණිය

# ඉතිහාසය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **පහත සඳහන් ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 ස්පාඤ්ඤයේ රජ වූ දෙවන පිලිප් රජු ලන්දේසින්ට ..................................................වරාය තහනම් කරන ලදී.

02 ලන්දේසින්ගේ පෙරදිග මූලස්ථානය වූ බතාවිය පිහිටා තිබුනේ ........................................................ දූපතේය.

03 ලන්දේසින් වැඩිකාලයක් යහපත් සම්බන්ධතා පැවැත් වූ රාජ්‍යය වූයේ .................................................. රාජ්‍යයයි.

04 බ්‍රිතාන්‍යයන් විසින් ලන්දේසි ජාතික විලියම් කුමරුගෙන් ලබා ගත් ලිපිය ................................................. ලිපිය ලෙස හැඳින්වේ.

05 ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම ලංකාවේ බදු එකතු කිරීම සඳහා පත් කළේ ................................................. නම් මදුරාසි නිලධාරීන්ය.

(ජාවා, ලිස්බන්, අවුමිල්දාර්වරු, කිවි, උඩරට, සුමාත්‍රා)

- **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් වරහන් තුළ (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

06 ඕලන්ද පාලකයා ලන්දේසි සමාගම් කීපයක් එකතු කර VOC සමාගම පිහිටුවන ලදි. ( )

07 ලන්දේසින් 1638 වසරේ සෙනරත් රජු සමඟ ගිවිසුමක් ඇති කර ගන්නා ලදි. ( )

08 ලන්දේසින් කුඩා බලකොටුවක් ඉදිකළ ප්‍රදේශයක් ලෙස අලිමංකඩ හැඳින්විය හැක. ( )

09 ඉංග්‍රීසින්ගේ පළමු උඩරට ආක්‍රමණයට නායකත්වය දෙන ලද්දේ රොබට් බ්‍රවුන්රිග්ය. ( )

10 මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා විසින් උඩරට රාජධානියේ තොරතුරු සෙවීමට ජෝන් ඩොයිලි නම් නිලධාරියා පත් කරන ලදී. ( )

- **පහත වගු සටහනේ හිස්තැන් ඇසුරින් 11 - 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| උඩරට රජු | ලන්දේසි දූතයා | දූතගමනට හේතුව |
|---|---|---|
| පළමු විමලධර්ම සූරිය රජු | 11 .................................................. | වෙළඳ කටයුතු පිළිබඳව රජු සමඟ සාකච්ඡා කිරීම |
| 12 ................................................ | ජෙනරාල් ජෙරාඩ් හල්ෆට් | රජු බැහැදැකීමට ලැබුණ ආරාධනයකට |
| දෙවන විමලධර්මසූරිය | කලන් අල්බස් | 13.................................................. |
| 14 ................................................ | කොරනේලිස් ට්‍රැකලි | 15 ................................................ |

● **පහත සඳහන් ප්‍රශ්න වලට ගැලපෙන නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.**

16 පින්තූරයේ සඳහන් වන්නේ එක්තරා වෙළඳ සමාගමකට අයත් ලාංඡනයකි. එය අයත් වන රට කුමක් ද?




(1) බ්‍රිතාන්‍යය

(2) ඕලන්දය

(3) ප්‍රංශය

(4) පෘතුගාලය

17 දෙවන රාජසිංහ රජු විසින් රන්මාලයක්, මුද්දක්, හා රන් පා වැසුම් බඳනයක් ලබාදුන් ලන්දේසි ජාතික දූතයා වන්නේ මින් කවරෙක්ද?

(1) ජෙනරාල් ජෙරාඩ් හල්ප්ට් (2) ජෝන් ඩොයිලි

(3) කලන් අල්බස් (4) තෝමස් මේට්ලන්ඩ්

18 ඉංග්‍රීසින්ට ත්‍රිකුණාමලය යුධමය අතින් වැදගත් වූයේ කුමන ජාතියක් සමඟ කරගෙන ගිය සටන් වලදී ද?

(1) පෘතුගීසි (2) ඕලන්ද (3) ප්‍රංශ (4) ශ්‍රී ලාංකික

19 1818 නිදහස් අරගලයට දායකත්වය දුන් තැනැත්තෙක් මෙම පිළිතුරු අතරින් තෝරන්න.

(1) ඩිංගිරාල (2) පුරන්අප්පු (3) කැප්පෙටිපොළ (4) ගොන්ගාලේගොඩ බණ්ඩා

20 1848 නිදහස් අරගලය සිදුවූයේ කුමන ආණ්ඩුකාරවරයා ගේ කාලයේද?

(1) ටොරින්ටන් ආණ්ඩුකාරවරයා (2) එඩ්වඩ් බාන්ස්

(3) තෝමස් මෙට්ලන්ඩ් (4) පෙඩ්රික් නෝර්ත්

(ල. 20 × 2 = 40)

## 09 ශ්‍රේණිය ඉතිහාසය - II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (අ) (A) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු පුවක් ඇතුන්, ඇත්දළ ඉන්දියාවට යැවීමට උදව්කරගත් A අක්ෂරයෙන් දැක්වෙන වරාය කුමක් ද?

(B) උස්බිම් වල කාලතුවක්කු සවිකොට පෘතුගීසින්ගෙන් අල්ලාගත් බලකොටුව B අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද?

(C) ලන්දේසින් කුඩා බලකොටුවක් ඉදිකළ ප්‍රදේශයක් C අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද?

(D) ලන්දේසි පාලන ප්‍රදේශයක් වන ගාලු කමන්ඩරිය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 4)



(ආ) (1) පින්තූරයෙන් දක්වෙන සුහද හමුවීම කුමක් ද?
(2) මෙහි රජු සමඟ සිටින්නේ කුමන ජාතිකයෙක් ද?
(3) රජුගේ හා ඔහුගේ අරමුණ සඳහන් කරන්න.
(4) මෙම රජතුමාගේ කාලයේම ලංකාවට පැමිණි තවත් දූතයෙකු සඳහන් කරන්න. (ල. 4)



(ඇ) පහත සඳහන් A B C D ප්‍රකාශ වලට අදාළ පුද්ගලයන්ගේ නම් එම ප්‍රකාශ වලට ඉදිරියෙන් ලියා දක්වන්න.

A - 1638 ලන්දේසින් සමඟ ගිවිසුම් අත්සන් කළ රජතුමා
B - උඩරටියන් ඉතා අලංකාර පෙරහැරකින් කැඳවාගෙන ගිය ලන්දේසි ජාතිකයා
C - කුණ්ඩසාලේ කුමාරයා ලෙස ප්‍රසිද්ධියට පත් රජතුමා
D - නායක්කාර් රාජවංශයේ ආරම්භක පාලකයා. (ල. 4)



(ඈ) (i) ඉහත ගොඩනැගිල්ලෙන් පෙන්වන්නේ කුමන ජාතියකට අයත් ගෘහ නිර්මාණ ශිල්පය ද? (ල. 1)
(ii) ඔවුන් ආභාෂයට ගෙන ඇත්තේ කුමන රටක ගෘහනිර්මාණ ශිල්පයෙන් ද? (ල. 1)
(iii) ගොඩනැගිල්ලේ ගෘහනිර්මාණ වල ලක්ෂණයක් ලියන්න. (ල. 1)
(iv) එම ජාතීන්ගෙන් සිංහල භාෂාවට එකතු වූ ගෘහ භාණ්ඩයක නමක් ලියන්න. (ල. 1)

(ලකුණු 16)

02. (i) 1602 දී පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම හෙවත් VOC සමාගම පිහිටුවීමට රාජකාරී අධිකාරි පත්‍රය ලැබුණ පසුව ඔවුන්ට ආසියාවේ දී ලැබුණු බලතල 03 ක් සඳහන් කරන්න. (ල. 3)

(ii) 1656 ලංකාවට දූතගමනක යෙදුන ජෙරාඩ් හල්ෆ් II වන රාජසිංහ රජුට ලබා ත්‍යාග ලෙස ලබාදුන් දෑ තුනක් නම් කරන්න. (ල. 3)

(iii) II වන රාජසිංහ හා ලන්දේසින් අතර ලිපි හුවමාරුවේදි සුහදතාව ආරක්ෂාව සඳහා යෙදූ උපක්‍රම 2 ක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

03. (i) පහත සඳහන් ප්‍රකාශ අතරින් උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයට අයත් ප්‍රකාශ 3 ක් තෝරා ලියන්න. (ල. 3)

- 1638 ගිවිසුම අත්සන් කිරීම
- පිටිගල් කෝරළයේ කුරුඳු තැලීමට ලන්දේසින්ට පනවා තිබූ තහනම ඉවත් කිරීම
- සියම් නිකාය ආරම්භ කිරීම
- උඩරට ප්‍රදේශ හරහා ඇතුන් ගෙනයාම තහනම් කිරීම
- 1766 ගිවිසුම අත්සන් කිරීම
- සිබෝල් ද වාට්ගේ පැමිණීම
- ජෝන් ෆයිබස්ගේ පැමිණීම

(ii) ලන්දේසි පාලන ප්‍රදේශ වලට සම්බන්ධ රූපික සැලැස්මක් පහත දක්වේ. එහි ඇති හිස්තැන් සම්පූර්ණ කරන්න.

ලන්දේසි පාලන ප්‍රදේශ

| පාලන ප්‍රදේශය | පාලන ප්‍රදේශය | පාලන ප්‍රදේශය |
|---|---|---|
| (1) .......................... | ගාලුකමාන්ඩරිය | (3) ........................... |
| පාලන කළ නිළධාරින් | පාලන කළ නිළධාරින් | පාලන කළ නිළධාරින් |
| ආණ්ඩුකාරවරයා | (2) ............................. | කොමදෝරු |

(ල. 3)

(iii) ලන්දේසීන් තම ආගම ප්‍රචාරය කිරීමේ ක්‍රමවේදයක් ලෙස අධ්‍යාපනය හා රජයේ තනතුරු නම්බුනාම දීම භාවිතා කරන ලදී එහිදී අධ්‍යාපනය තුළින් ආගම ප්‍රචාරය කිරීමට කටයුතු කළ ආකාරය දක්වන්න. (ල. 5)

04. (i) 18 වන සියවස අවසානය වන විට ඉංග්‍රීසින් මෙරට කෙරෙහි අවධානය යොමු කළහ. මෙලෙස ලංකාවට අවධානය යොමු කිරීමට බල පෑ හේතු තුනක් නම් කරන්න. (ල. 3)

(ii) පහත සඳහන් වන්නේ ලංකාවට පැමිණි ඉංග්‍රීසි දූත කණ්ඩායම් තුනකි. ඔවුන් පැමිණෙන විට උඩරට රාජධානියේ රජකළ රජවරුන් ඉදිරියෙන් ලියා දක්වන්න.

| මෙරටට පැමිණි ඉංග්‍රීසි දූතයා | උඩරට රජවරු |
|---|---|
| • ජෝන් ෆයිබස් | ........................................ |
| • හියුබොයිඩ් | ........................................ |
| • රොබට් ඇන්ඩෘස් | ........................................ |

(ල. 3)

(iii) 1796 දී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බදු එකතු කිරීම සම්බන්ධයෙන් කැරැල්ලක් ඇති විය. එයට බල පෑ හේතු 3 ක් ලියා පැහැදිලි කරන්න. (ල. 5)

05. (i) මුහුදුබඩ ප්‍රදේශ වල බ්‍රිතාන්‍යයන් ගෙන ගිය පාලන ක්‍රම තුන නම් කරන්න. (ල. 3)

(ii) 1803 සර් පෙඩ්රික් නෝර්ත්ගේ උඩරට ආක්‍රමණයට බලපෑ හේතු 3 ක් නම් කරන්න. (ල. 3)

(iii) ඉංග්‍රීසින්ගේ 1803 උඩරට ආක්‍රමණයට මුහුණ දීමේදී උඩරැටියන් උපක්‍රමශීලීව කටයුතු කළ ආකාරය උඩරැටියන්ගේ ජයග්‍රහණයට හේතු විය. ඔවුන් උපක්‍රම ශීලී වූ ආකාරය කරුණු 3ක් ඇසුරින් ලියන්න. (ල. 5)

06. (i) 1805 ලංකාවට පත්ව ආ සර් තෝමස් මේට්ලන්ඩ් උඩරට රාජ්‍යය සම්බන්ධයෙන් අනුගමනය කළේ උපායශීලී ප්‍රතිපත්තියකි. එම උපායශීලී ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 3)

(ii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලය තුළ උඩරට රාජධානියේ අභ්‍යන්තර බල අරගල උග්‍ර විය. රජු විසින් බල අරගලය ඇති කරගත් කණ්ඩායම් 3 ක් නම් කරන්න. (ල. 3)

(iii) 1848 නිදහස් අරගලයට 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වල බලපෑම සිදු වූ ආකාරය ප්‍රතිසංස්කරණ 2ක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

07. (i) 1848 නිදහස් අරගලයේ නායකයන් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

(ii) පහත සඳහන් උපකාරක පද ඇසුරින් හරස් පද ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට

1. 1848 නිදහස් අරගලය මර්දනයට මෙම නීතිය පනවන ලදි.
2. ටොරින්ටන් ආණ්ඩුකාරවරයා පනවන ලද බද්දකි.
3. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමග ආරවුල් ඇතිකරගත් භික්ෂූන් වහන්සේ නමකි.
4. 1797 නිදහස් කැරැල්ලට හේතු වූ බද්දකි.

පහළට

1. 1848 නිදහස් අරගලය ආරම්භ වූ ප්‍රදේශය
2. ඇහැලේපොල අදිකාරම් පිටුවහල් කළ දිවයින මේ නමින් හැඳින්වේ.
3. 1848 නිදහස් අරගලය පැතිරුණු ප්‍රදේශයකි.
4. තෝමස් මෙට්ලන්ඩ් විසින් උඩරට සමඟ උපක්‍රමශීලීව කටයුතු කිරීමට පත්කළ අයෙකි.




(ල. 8)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ලිස්බන් 02. ජාවා 03. උඩරට 04. කිවි ලිපිය 05. අවුම්ල්දාර්වරු 06. (✓) 07. (×)
08. (✓) 09. (×) 10. (✓) 11.ජොරිස්වැන් ස්පිල් බර්ජන් 12. දෙවන රාජසිංහ රජු
13. රජු හා ලන්දේසින් අතර නව ගිවිසුමක් ඇති කර ගැනීමට සාකච්ඡා කිරීමට 14. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍ර සිංහ
15. රජුගේ බිසව මියයාම පිළිබඳව ලන්දේසීන් ගේ ශෝකය ප්‍රකාශ කිරීම 16. (2) 17. ( 1 ) 18. (3) 19. ( 3 ) 20. (1)

(2 x 20 = ල. 40)

## II කොටස

01. අ. 1. A - කල්පිටිය (ල. 1) B - කොළඹ (ල. 1) C - පේදුරු තුඩුව (ල. 1)
E අක්ෂරය (ල. 1) (මුළු ලකුණු 4)

ආ. 1. විමලධර්මසූරිය රජු හා ලන්දේසි ජාතික ස්පිල්බර්ජන්ගේ හමුවීම.
2. ලන්දේසි ජාතිකයෙක් (ඕලන්ද)
3. පෘතුගීසීන් මුහුදු බඩ ප්‍රදේශ වලින් එළවා දැමීම
4. සීබෝල් ද චාට් (ල. 4)

ඇ. A - II වන රාජසිංහ රජතුමා B - ජෙනරාල් ජෙරාඩ්හල්ප්ට්
C - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ D - ශ්‍රී විජය රාජසිංහ (ල. 4)

ඈ 1. ඕලන්ද 2. රෝම 3. උස් වහල යෙදූ නිවාස, ඉස්තෝප්පුව, සොල්දරය, කුලුණු
4. අල්මාරිය (ල. 4)

02. 1. ● ආසියාවේ වෙළඳාම් කිරීමට ● ප්‍රදේශ යටත් කිරීමට ● බලකොටු ඉදි කිරීම
● ආණ්ඩුකාරවරුන් පත් කිරීම ● අදාළ ප්‍රදේශ පාලනය කිරීම යන ඒවායින් 3ක් ලිවීමට (ල. 3)

2. ● පෘතුගීසීන්ගෙන් අන්තර්ගත කොඩි ● අශ්වයන් දෙදෙනෙක් ● පර්සියානු දුනු ඊතල කට්ටල දෙකක්
● සඳුන් දුව ● පර්සියන් බැටලුවන් දෙදෙනෙක් ● තවත් සතුන් කිහිපදෙනෙකු මේවායින් 3ක් දැක්වීමට.

3. ● "රජු ලන්දේසීන්ට ලිපි ලියන විට මට සේවය කරන හිතවත් ලන්දේසි ජාතිය " යනුවෙන් ද?
● ලන්දේසින් රජුට ලිපි ලියනවිට ලිපිය අවසන් කිරීමට ඔබ වහන්සේගේ සුමට කීකරු සේවක
● රජු ලන්දේසින්ට ලිපි ලිවීමේ දී තමා ලංකාවේ අධිරාජයා ලෙස ද
● ලන්දේසි රජුට ලිපි ලිවීමේ දී ත්‍රි සිංහලාධීශ්වර යැයි නාමිකව සඳහන් කර ඇත. (කරුණු 2ක් ලිවීමට ල. 2 විස්තර කිරීමට ල. 3 = ල. 5)

03. (i) ⋆ සියම් නිකාය ආරම්භ කිරීම ⋆ 1766 ගිවිසුම අත්සන් කිරීම ⋆ ජෝන් ෆයිබන්ගේ දූතගමන සිදුවීම (ල. 3)
(ii) 1. කොළඹ කමාන්ඩරිය 2. කොමදෝරුවරයෙක් වෙනම පත් කිරීම 3. යාපන කමාන්ඩරිය.
(iii) ⋆ ඉස්කෝල නම් අධ්‍යාපන ආයතනය ආරම්භ කිරීම ⋆ ගම් කීපයකට එක් පාසලක් ආරම්භ කර එම ප්‍රදේශයේ දරුවන් එම පාසලට ඒම අනිවාර්ය කිරීම ⋆ දරුවන්ට මව් බසින් අධ්‍යාපනය ලබා දීම
⋆ රෙපරමාදු ආගමේ යාඥා වලට විෂයමාලාවේ විශේෂ තැනක් ලැබීම ⋆ ස්වභාෂාව, සංගීතය දේවධර්මය ඉගැන්වීම ⋆ කොළඹ පිහිටි සෙමනේරිය මගින් ලන්දේසි භාෂාවෙන් උසස් අධ්‍යාපනය ලබා දීම. (කරුණු 2 ලිවීමට ල. 2 කි. පැහැදිලි කිරීමට ල. 3 = 5)

04. (i) ● ඉතා උසස් තත්ත්වයේ කුරුඳු හා කුළුබඩු ලබා ගත හැකි වීම ● කුළු බඩු හැරුණු විට මුතුමැණික්, ඇත් දළ, අලි ඇතුන්, වෙළඳාමේදී වැදගත් වීම. ● බ්‍රිතාන්‍යයන් විසින් නිපදවන ලද භාණ්ඩ මෙරට අලෙවි කිරීමට වෙළඳපල සකසා ගැනීමට (ල. 3)
(ii) ⋆ ජෝන් ෆයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජු ⋆ හියුබොයිඩ් - රාජාධි රාජසිංහ රජු ⋆ රොබට් ඇන්ඩෲස් - රාජාධි රාජාසිංහ රජු ( ල. 3)
(iv) ● වෙළඳ සමාගම බදු පැනවීම - පොල්ගස් බද්ද, ලුණු බද්ද, මාළු බද්ද, දුම්කොළ බද්ද ● බදු එකතු කිරීමේ දේශීය නිලධාරින් ඉවත් කොට මදුරාසියෙන් නිලධාරින් ගෙන්වීම - අවුම්ල්දාර් ලෙස හැඳින්වූ නිලධාරින් යෙදවීම නිසා ජනතාව තුළ වූ විරෝධ වීම ● භාණ්ඩ වලින් බදු ගෙවීම වෙනුවට මුදලින් බදු ගෙවීමට සිදුවීම. මුදල් භාවිතය ප්‍රචලිත නොවූ නිසා ජනතාව මෙය පුරුදු දෙයක් නොවීම. (ල. 2 x 3 විස්තර කිරීමට ල. 3 = 5)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

05. (i) ● වෙළඳ සමාගම් පාලනය ● ද්විත්ව පාලනය ● කිරීට පාලනය (ල. 3)

(ii) ★ ඉංග්‍රීසි පාලන ප්‍රදේශවල සිටි ලාංකිකයන් උඩරට රජු තම රජු ලෙස සැලකීම

★ පහත රට වන ඉංග්‍රීසි විරෝධී කැරලි වලට උඩරට රජු උදව් කරතැයි ඉංග්‍රීසින් සිතීම.

★ ත්‍රිකුණාමලය හා කොළඹ අතර ගොඩබිමින් සම්බන්ධ තා පැවැත්වීමෙන් උඩරට රාජ්‍යය බාධාවක් වීම.

★ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව රජු ප්‍රංශ ජාතින්ගේ උදව් ලබා ගනිමි යැයි ඉංග්‍රීසින් සිතීම (මේවායින් තුනක් දැන්වීමට ලකුණු 3 යි)

(iii) ● වර්ෂා කාලය එනතෙක් උඩරැටියන් සටන පමා කිරීම

● වැසි කාලය එළඹි පසු මහනුවර හා කොළඹ අතර සම්බන්ධතා පැවැත් වූ ප්‍රධාන මාර්ග සියල්ල අවහිර කිරීම.

● ඉංග්‍රීසි හමුදාවට අවශ්‍ය ආහාර හා යුධ උපකරණ සැපයිම නවතා දැමීම

● නගරයට පිවිසුම් මාර්ග අවහිර කිරීම. (ඉහත කරුණු 2 නම් කර පැහැදිලි කිරීමට ල. 5)

06. (i) ★ උඩරට රාජධානිය තුළ අභ්‍යන්තර භේද පුළුල් වන ආකාරයට කටයුතු කිරීම

★ රාජධානියේ සියලු තොරතුරු රහසිගතව රැස් කිරීම

★ මෙම කාර්යයන් සඳහා දක්ෂ නිලධාරියකු පත් කිරීම (ල. 3)

(ii) ● රජ හා රදළ ප්‍රධානීන් ● රජු හා භික්ෂූන් වහන්සේලා ● රජු හා සාමාන්‍ය ජනතාව (ල. 3)

(iii) ★ 1840 මුඩුබිම් පනත මගින් සාමාන්‍ය ජනතාවට ගොවිබිම් හා ඉඩම් රාශියක් අහිමි කිරීම.

★ ජනතාවට වගා කිරීමට මේ හේතුව නිසා ඉඩම් අහිමි වීම් වතු වගා කළ ව්‍යාපාරිකයන් එම ඉඩම් ලබාගෙන වතු වගාව කිරීම. වතු වගාවට යොමු වීම නිසා දේශීය කෘෂි කර්මාන්ත බිඳ වැටීම

★ ගම්සභාව අඩපණ වීම - ග්‍රාමීය ප්‍රදේශ වල වැඩි අමුණු වේලි නඩත්තුව හා ප්‍රදේශය තුළ ආරවුල් විසඳීම අඩපන වීම.

★ බ්‍රිතාන්‍ය පාලනය යටතේ බුදු දහම නොසලකා හැරීම - ඉහත කරුණු වලින් 2 ක් නම් කර පැහැදිලි කිරීම (ල. 5)

07. (i) ● ගොංගාලේ ගොඩ බණ්ඩා හෙවත් පැලියගොඩ ඩේවිඩ්

● පුරන් අප්පු හෙවත් ප්‍රැන්සිස්කෝ

● ඩිංගි රාල (ල. 3)

(ii) හරහට 1. මාෂල් ලෝ 2. මුද්දර බද්ද 3. පරණාතල හිමි 4. ලුණු බද්ද

පහළට 1. මාතලේ 2. මුරුසි 3. නුවර කලාවිය 4. ජෝන් ඩොයිලි (ල. 8)